# ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය

කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය

දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1) 244-9070

විද්‍යුත් තැපෑල: shenjy@state.gov http://srilanka.usembassy.gov

නිවේදන අංක: 20170123

**යූඑස්එස් හොපර් නෞකාවේ පැමිණීම, වර්ධනය වන ද්වි-පාර්ශවික සහයෝගිතාව දක්වයි.**

**කොළඹ, ජනවාරි 23, 2016:** එක්සත් ජනපද -ශ්‍රී ලංකා සබඳතා ශක්තිමත් කිරීමටත් 2016 සැප්තැම්බර් මාසයේ දී යූඑස් එස් හොපර්හි නැවියෙකුට හදිසි වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමට ශ්‍රී ලංකා නාවික හමුදාව ලබාදුන් සහායට ස්තුති කිරීමටත් කොළඹ වරායට පැමිණි යූඑස්එස් හොපර් නෞකාවේ පස් දින සංචාරය අවසන් විය.

“අපේ දෙරටේ නාවික හමුදා අතර ඇති සහයෝගය ඉන්දු-පැසිෆික් කලාපයේ සාගර සුරක්ෂිතතාව වැඩිදියුණු කරන“ බව ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානා පති වන අතුල් කෙෂාප් මහතායි. “අපේ එක්සත් ජනපද නාවිකයෙකුගේ සෞඛ්‍යය හා ආරක්ෂාව සහතික කිරීමට ශ්‍රී ලංකාව දැක්වූ ක්ෂණික හා මිත්‍රශීලී ප්‍රතිචාරය මේ පිළිබඳ තවත් එක් උදාහරණයකි“.

මෙම සංචාරය තුළදී එක්සත් ජනපද නාවිකයන් කණ්ඩායම, ක්‍රීඩා හා සංස්කෘතික වැඩසටහන්වලට සහභාගිවූ අතර ඔවුන්ගේ ශ්‍රී ලාංකික සගයන් සමග බේරා ගැනීමේ හා මුහුදේ නැව් පරීක්ෂා කිරීමේ උපායාත්මක පුහුණුවකටද සහභාගි වූහ. මෙයට අමතරව ගාල්ලට ගිය මෙම නාවිකයෝ ශ්‍රී ලංකාවේ පළමුවැනි එක්සත් ජනපද වාණිජ නියෝජිතයා ලෙස 1850 දී පත් කරන ලද ජෝන් බ්ලැක් හා ඔහුගේ බිරිඳ වූ ඉසෙබෙල් ගේ සොහොන් ඇති සියලු සාන්තවරයන්ගේ සුසාන භූමිය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතුවලටද ඔවුන්ගේ සහාය ලබා දුන්නේය.

යූ එස් එස් හොපර් පිළිබඳ වැඩි තොරතුරු ලබාගැනීම සඳහා පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසෙන්න. http://www.public.navy.mil/surfor/ddg70/Pages/default.aspx